# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1948/39 - 2016 ජනවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2016.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : WGSWD&EIP/ACQ/KB/15 .

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2012/LRB/323.

වෙරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, පිළියන්දල බෝකුන්දර පිහිටි මහ ඇළ මාර්ගයේ සිට පිළියන්දල ගංහාරාම පාර දෙසට විහිද ඇති අතුරු ඇළ මාර්ගය හා 120 බස් මාර්ගය අතර පිහිටි වෙල්යායේ ජල රක්ෂිතයක් සකස් කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පවරා ගන්නා ලද ඉඩමේ විස්තරය

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 575 බෝකුන්දර ග්‍රාම නිලධාරි වසමේ බෝකුන්දර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 521211 හා 2015.12.17 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 180 සිට 186 දක්වා වශයෙන් අංකනය කර පෙන්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1752ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 07.

1. **කැබලි අංක 180**
ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: ගෙවත්ත (තාවකාලික ගොඩනැගිල්ලෙන් කොටසක් ඇත); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0133.

2. කැබලි අංක 181
ඉඩමේ නම: පරස්තාවල ඉඩම; විස්තරය: ගෙවත්ත (ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් ඇත); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කේ. ඒ. ඩී. ජයන්ත චන්ද්‍රසිරි මයා, අංක 308, කනත්තගොඩ, බණ්ඩාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0034.

3. කැබලි අංක 182
ඉඩමේ නම: පරස්තාවල ඉඩම; විස්තරය: ගෙවත්ත (ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් ඇත); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: නිලන්ත ඉන්දජී මඩවල, අංක 40/3, මඩපාත පාර, මාම්පේ, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0052.

4. කැබලි අංක 183
ඉඩමේ නම: පරස්තාවල ඉඩම (වරිපනම් අංක 595, 597 කොළඹ පාර; විස්තරය: ගෙවත්ත (ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් ඇත); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: වල්පිටගමගේ සිරිසේන මයා, අංක 33, විද්‍යාල මාවත, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0104.

5. කැබලි අංක 184
ඉඩමේ නම: කලස්සේ කුඹුර *හෙවත්* රන්මුදුවාවල කුඹුර (අංක 370/3/1/A කොළඹ පාර; විස්තරය: ගෙවත්ත (ස්ථිර ගොඩනැගිල්ලක්, තාවකාලික ගොඩනැගිල්ලක් සහ තාවකාලික ගොඩනැගිල්ලෙන් කොටසක් ඇත); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: හපුතන්ත්‍රිගේ උපසේන කාරියවසම් මයා, අංක 113/10, ශ්‍රී දේවානන්ද මාවත, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1032.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 22838 - 30 - (2016/01)

**6. කැබලි අංක 185**

ඉඩමේ නම: කලස්සේ කුඹුර හෙවත් රන්මුදුවාවල කුඹුර (අංක 370/3/1/ඒ කොළඹ පාර; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: හපුතන්ත්‍රිගේ උපසේන කාරියවසම් මයා, අංක 113/10, ශ්‍රී දේවානන්ද මාවත, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0058.

**7. කැබලි අංක 186**

ඉඩමේ නම: කඳුරුගහ ඕවිට කුඹුර (ව. අ. 785 කොළඹ පාර); විස්තරය: ගෙවත්ත (ස්ථිර ගොඩනැගිල්ලක් ඇත); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: තිත්තගල් ගමගේ ගුණදාස මයා සහ සීලා පද්මිණි අතුකෝරාළ මිය, අංක 369/5, බෝකුන්දර, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0339.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 පෙබරවාරි මස 25 වැනි දින පෙ. ව. 10.00 ට රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරණ ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. ඩබ්. අබේසූරිය,<br>
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,<br>
වේරස් ගඟ වැසි ජල අපවහන හා<br>
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2016 ජනවාරි මස 04 වැනි දින,<br>
වේරස් ගඟ වැසි ජල අපවහන හා<br>
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,<br>
වැලිකඩ, රාජගිරිය

01-809

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.